# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2010/2 – 2017 මාර්තු මස 13 වැනි සඳුදා – 2017.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය**

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (4) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මේ නියමය මඟින්,

(අ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පවරා දී ඇත්තාවූද, මේ නියමයේ පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇත්තාවූද, හුට්විල් වත්ත නොහොත් හයිටිවිල්ලෙ වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1982 මැයි මස 31 වැනි දින අංක 195/6 දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (1) වැනි වගන්තිය යටතේ කරන ලද නියමයේ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති හුට්විල් වත්ත නොහොත් හයිටිවිල්ලෙ වත්ත නැමති ඉඩමේ බිම් ප්‍රමාණයට අදල වන්නා වූ කොටස, ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරනු ලැබීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදළ නියමය හෝ කොන්දේසි අනුව ක්‍රියාකර නොමැතිවීමේ පදනම මත ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් ඒ නියමය සංශෝධනය කරමි; සහ

(ආ) මේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම මත මෙම නියමයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2017 පෙබරවාරි මස 07 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහලේකම් කාර්යාලය,
මිහිකත මැදුර,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.


1A – G 25261 – 37 (03/2017)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළමුවන උපලේඛනය

*ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ඇති හුට්විල් වත්ත නොහොත් හයිටිවිල්ලෙ වත්ත නම් ඉඩමේ විස්තර*

| අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය සහ දිනය | වතු ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරන ලද ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් වලින් |
|---|---|---|---|---|
| 1982.05.31 අංක 195/6 | හුට්විල් වත්ත නොහොත් හයිටිවිල්ලෙ වත්ත | නුවරඑළිය | නුවරඑළිය | 488.25 |

## දෙවන උපලේඛනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තර.

| විශේෂ අංකය | ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිළධාරී කොට්ඨාසය (ගම) | කොමිෂන් සභාවට පැවරෙන ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| කො/695 11/PCE/NE/88 | හුට්විල් වත්ත නොහොත් හයිටිවිල්ලෙ වත්ත | නුවරඑළිය | නුවරඑළිය | ආගරපතන | මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිඹුල කෝරලේ සුළු කොට්ඨාසයේ ආගරපතන ගමේ පිහිටි හුට්විල් වත්ත නොහොත් හයිටිවිල්ලෙ වත්ත නැමති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සුමන්ගලි සුබ්‍රමනියම් මහත්මියගේ අංක 4091/2017 හා 2017.01.27 දිනැති පිඹුරෙහි කැබලි අංක 01 සිට 71 දක්වා පෙන්නුම් කර ඇති, අක්. 03, රූඩ්. 0, පර්. 17 කින් යුත් (හෙක්ටයාර් 1.2567) බිම් ප්‍රමාණයට මායිම් උතුරට :- හුට්විල් වත්ත නොහොත් හයිටිවිල්ලෙ වත්ත සහ මාර්ගය, නැගෙනහිරට :- මාර්ගය, දකුණට :- මාර්ගය, බස්නාහිරට :- මාර්ගය ද වේ. |

03 – 1138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.